# ගණ්ඨික දේව මාතාවන්ට යාච්ඤාව



කන්‍යා මරියනි, දැහැමි දයාවේ මාතෘනි, අසරණ දරුවකුගේ සරණයට පැමිණීම කිසිදා ප්‍රතික්ෂේප නොකරන මාතාවෙනි, ඔබතුමියගේ හෘදය තුළ පවතින දිව්‍ය දයාවෙන් සහ අපරිමිත දයානුකම්පාවෙන් ඔබතුමියගේ දෑත් මෙහෙය වන බැවින්, ඒවා තම දයා හරිත දරුවන්ගේ සේවය වෙනුවෙන් යෙදීම කිසිදා අත් නොහරින මාතාවෙනි, මා වෙත සානුකම්පිත දෙනෙත් යොමා, මගේ ජීවිතයේ ඇති ගැට පැටලිල්ල දෙස බැලුව මැනව. ඒ හේතුවෙන් මා කොතරම් අන්ත අසරණද, කොතරම් වේදනාවක සිටි ද සහ මේ බැමි වලින් කොතරම් බන්ධනය වී සිටීද යන වග ඔබතුමිය හොඳාකාරව ම දන්නීය. තමන් වහන්සේගේ දරුවන්ගේ ජීවිත ගැට ලිහන්නට දෙවිමහොත්තමයාණන් වහන්සේ විසින් පවරනු ලැබූ මාතාව වන මරියාවෙනි, ඔබතුමියගේ දෑතට මාගේ ජීවිත පීත්ත පටිය බාර දෙන්නෙමි. යක්ෂයා ඇතුළු කිසිම කෙනෙකුට එය ඔබතුමියගේ අමිල රැකවරණයෙන් උදුරා ගන්නට

නොහැකිය. ලිහන්නට බැරි කිසිදු ගැටයක් ඔබතුමියගේ දෑතේ නොරැඳෙන්නේය. බලගතු මාතාවෙනි, ජේසුස් නම් ඔබතුමියගේ පුත්‍රයාණන් වහන්සේ සහ මාගේ විමුක්තිදායකයාණන් සමග පවතින මැදිහත්කමේ බලයෙන් සහ ඔබතුමියගේ වරප්‍රසාදයෙන් අද දින මේ ගැටය / ගැටළුව ඔබතුමියගේ දෑතට බාරගත මැනව්.

(ඔබගේ ඉල්ලීම සඳහන් කරන්න)

දෙවියන් වහන්සේගේ මහිමය පිණිස එය ලිහා දෙන ලෙස මම උදක් ම කන්නලව් කරමි. ඔබතුමිය මාගේ බලාපොරොත්තුවයි. අහෝ මාගේ ස්වාමි දුවෙනි, දෙවියන් වහන්සේ මා වෙත දානය කරන එකම සැනසීම ඔබතුමියයි. දුර්වල වූ මා ශක්තිමත් කරන බලකොටුවයි. මගේ අන්ත නිස්සාරබවේ සරුසාරකමයි. ක්‍රිස්තු සමිදාණන් වහන්සේ සමඟ මාගේ බැම්වලින් මා ලබන නිදහසයි. මගේ සරණයෙහි, මට සවන් දුන මැනව, මා ආරක්ෂා කළ මැනව. ආමෙන්.

ජේසුනි මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.